" සව්සිරිපාය " විවෘත කිරීමේ අවස්ථාවේ දී

අග්‍රාමාත්‍ය

# ගරු ආර්. ප්‍රේමදාස මැතිතුමා විසින්

පවත්වන ලද කථාව

*1987 සැප්තැම්බර් මස 20 වැනි දින*

*The Address*
*of the*

# Hon. R. Premadasa, M.P.

**Prime Minister**

on the occasion of the
opening of Savsiripaya
20th September 1987

BKT 0164
/08/2023

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

# 1987 සැප්තැම්බර් 20 වැනි දින " සව්සිරිපාය " විවෘත කිරීමේ අවස්ථාවේ දී අග්‍රාමාත්‍ය ගරු ආර්. ප්‍රේමදස මැතිතුමා කළ කථාව

අද අපි මෙතනට රැස්වෙලා ඉන්නෙ " සව්සිරිපාය " විවෘත කරන අවස්ථාවටයි. මෙ " සව්සිරිපාය " ඉදිකිරීම අභ්‍යාස සහ සංවර්ධන ආයතනයේත් ටවර් හෝල් රඟහල පදනමේත් ඒකාබද්ධ මූලස්ථානය වෙනවා. වෘත්තීය පුහුණුවකට ඇතුළත් වෙන්නෙ රළු පරළු කටයුතු. ඒ වගේ කටයුතු, සෞම්‍ය ලලිත කලා කටයුතුත් එක්ක එකම වහලක් යට කරගෙන යන්නෙ කොහොම ද කියල තමුන්නාන්සේලා සමහරවිට පුදුම වේවි. ඇත්තවශයෙන්ම, ඒ දෙක අහසට පොළොව වගේ පෙනෙන්න පුළුවනි. නමුත් වෘත්තීය හැකියාවත්, කලා රසාස්වාදයත් එක් තැන් කිරීම අවශ්‍යම දෙයක්. ඒකට හේතුව — මේ දෙකම අපේ ජීවිතේට නැතුවම බැරි නිසයි. කෑමක් රස වෙන්න ලුණු තිබුණට මදි ; ඇඹුලුත් තියෙන්න ඕනෑ. වෘත්තීය හැකියාවත් — කලා නිපුණත්වයත් ජීවිතයේ ලුණු ඇඹුල් හැටියටයි සැළකිය යුත්තෙ.

මගෙන් පළමුකොටම ඉටුවිය යුතු යුතුකමක් තියෙනව, මේ ආයතනය පිහිටුවන්න අපට ආධාර දීපු, ලෝක බැංකුවටත් එයට අනුබද්ධ විවිධ ආයතනවලටත් අපේ කෘතඥතාව පළ කරන්න ඕනෑ.

" සව්සිරිපාය " විවෘත කිරීමෙන් අපි තවත් දිණුම් කණුවක් පසුකලා වෙනවා. ඒක ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික, සංස්කෘතික පුනරුදයේ තවත් පියවරක්. මේ ආයතනය අපේ තරුණ කැළටයි පිරිනැමෙන්නේ. ඒ තරුණ පරපුරේ වැඩෙන අපේක්ෂා මුදුන්පත් කරවන්න මේ ආයතනයෙන් ප්‍රයත්නයක් ගන්නවා නියත යි. අපේ රටේ තරුණ තරුණියන්ගේ ප්‍රතිභා පූර්ණ ශිල්පීය හැකියාවත් — කලාකාමී රසඥතාවත් වැඩි දියුණු කරවන්න ආධාර වෙන්නයි අපේ අරමුණ.

මේ " සව්සිරිපාය " තුළින් අපේ හැදී වැඩීගෙන එන තරුණ පරම්පරාවට රටේ දේශපාලන තන්ත්‍රයටත් ආර්ථික ප්‍රගතියටත් සමාජ සුභසාධනයටත් හවුල්වීමට ආධාර උපකාර කෙරෙනවා. අපේ රජයේ

අපේක්ෂාව සමාජයේ හැම ක්ෂේත්‍රයකටම තරුණ පරපුර හවුල් කරගැනීමටයි. මෙය, අපේ ජන සමාජය මුළු හදවතින් ම ඉදිරිපත් කරන බලවත් වූ හදිසි ආයාචනයක් හැටියටයි අපි සලකන්නෙ. එය සාර්ථකව ඉටුකළ හැක්කේ ඊට අවශ්‍ය තිසි වාතාවරණය සකස් කිරීමෙනුයි. ඊට ගැලපෙන පදනම දැමිය යුතුයි. ඒ කාර්යය දැනටමත් අපි පටන් අරගනයි තියෙන්නෙ. ඕනැම ගමකට, ඕනැම නගරයකට ගිහින් බැලුවොත් මෙක පැහැදිලි වේවි.

අද අපේ තරුණ පරපුර රට පුරා තියෙන විවිධ ස්වේච්ඡා සංවිධානවල ක්‍රියාකාරී කොටසක් ඉටු කරනව. ඒ සංවිධාන තුළින් ඒ තරුණ පිරිසට ග්‍රාමෝදය මණ්ඩලවලත් තැනක් ලබාගන්න හැකිවෙලා තියෙනව. දේශපාලන පිටියේ වුණත් තරුණ පිරිස ප්‍රතිපත්ති සම්පාදනයටත් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමටත් සහභාගි කරවා ගන්න ඕනැ. සෑම උප දිසාපති කොට්ඨාශයකම පිහිටුවන්න යන ප්‍රාදේශීය සභා නොහොත් ග්‍රාම රාජ්‍ය ක්‍රමය තමයි රාජ්‍ය පාලනයට තරුණ සහභාගීත්වය ලබාගන්න පිළියෙළ කරපු ගැමේ මට්ටමෙ සංවිධානය. ඒ නිසා තමයි තරුණ ඡන්දදායකයන්, තරුණ පොදුජන සේවකයන් අපි මහජන කටයුතුවලට සම්බන්ධ කරවන්න උනන්දුවක් දක්වන්නෙ. වැඩට හපන්, වෙන කවුද තරුණ අය හැර ? දේශපාලන තන්ත්‍රයේ ජීව ශක්තිය හැටියට සලකන්නෙ වෙහෙස නොබලා සේවය කිරීමට ඇති කාය - චිත්ත ධෛර්යයයි. ඒ හැකියාව වැඩියෙන්ම ඇත්තේ තරුණ පරපුරටයි.

ආර්ථික පැත්තෙන් බැලුවොත් අපි තරුණ පිරිසට තිසි පුහුණුවක් ලබාදෙන්න ඕනැ. ඒක ඵල ප්‍රයෝජනයක් ඇති පුහුණුවක් වෙන්න ඕනැ. තමන්ගේ අපේක්ෂාත් බලාපොරොත්තුත් මුදුන්පත් කරවන පුහුණුවක් වෙන්න ඕනැ. මේ "සව්සිරිපාය" වගේ වෘත්තිය හා කලා මධ්‍යස්ථානයක වැදගත්කම තියෙන්නෙ ඒ අතිනු යි. මේ අරමුණ ඇතිව දැන් රට පුරා මධ්‍යස්ථාන පිහිටුවල තියෙනව. ඒ මධ්‍යස්ථානවලින් ඉටු කෙරෙන විමධ්‍යගත කටයුතුවලට කේන්ද්‍රස්ථානය වෙන්නෙ මේ " සව්සිරිපාය " යි.

අපට අරමුණු දෙකක් තියෙනව. එක අතකින්, අපි බලාපොරොත්තු වෙන්නෙ රැකියාවක් සඳහා පුහුණුවක් ලබාදීමෙන් ආර්ථික තත්ත්වයේ සැහෙන දියුණුවක් ඇති කරවන්නයි. අනික් අතින්, අපට වුවමනා වී තියෙන්නේ කලාවන් ගැනත්, සංස්කෘතිය ගැනත් දැනුමක්, පුහුණුවක්

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

ලබාදීමෙන් මානුෂික ගුණධර්ම ප්‍රගුණ කරවන්න යි. ශ්‍රී ලංකාවේ තරුණ පරපුරේ අනාගතය දිහා අපි බලන්නෙ ඒ විදිහටයි. ශ්‍රී ලංකාවේ යොවුන් පරපුර ගතින් සහ සිතින් තමන්ටත් රටටත් වැඩදායක පිරිසක් බවට පත්කර ගැනීම අපේ දර්ශනය යි.

මහා පරිමාණයේ ආර්ථික සංවිධාන – වෙළඳ, කාර්මික හා තාක්ෂණික වූ හැම ව්‍යාපෘතියක්ම, හැමවිටම, හැම ආකාරයකින්ම ක්‍රියා කළයුත්තේ හැකිතාක් දුරට මිනිස් ශ්‍රමය උපයෝගී කර ගැනීමට යි. අපට ඒ අතින් තරුණ පරපුර ඇතුළු මිනිස් සම්පත ඕනෑවටත් වඩා ඇති බව අමතක නොකළ යුතුයි. විශාල වශයෙන් අපට ඇති ඒ මිනිස් සම්පත රැක ගැනීමට අවශ්‍ය ආධාරය උපකාරය ඒ අන්දමට යොමු කළ පමණට යි ස්වල්ප වශයෙන් ඇති ලොකු ආයතන ආරක්ෂා කරගත හැක්කේ. එසේ නුවුනොත්, ලොකු ඒවා පොඩි අයගේ ඉලක්ක බවට පත්වීම වළක්වන්නට පුළුවන්කමක් නැහැ !

සමාජයීය අතිනුත් සංස්කෘතික අතිනුත් විනෝදාංශ අතිනුත් පහසුකම් තරුණ පරපුරේ අභිවෘද්ධිය සඳහා ඇති කළයුතු යි. සුගතදාස ක්‍රීඩාංගනයත් බෙත්තාරාම ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාපිටියත් කේන්ද්‍රකොට ගෙන රට පුරා ගම් නියම්ගම්වල දහස් ගණනින් ක්‍රීඩා පිටි ඇතිකරන්නෙ ඒ මඟින් තරුණ පරපුරේ මානසික – ශාරීරික වැඩිදියුණුව සඳහා යි. ටවර් හෝල් රඟහල පදනම ආභාෂයෙන් සිසු දරුවන්ගෙන් යොවුන් පරපුරේත් සහජ කලාකාමිත්වය ඔප් නැංවීමට ක්‍රියා කරන්නේ ඒ මඟින් ඔවුන්ගේ හැඟීම මටසිළිට්වන නිසයි. මානුෂික දයාදර්ශභාවයත් චරිත ශක්තියත් – තරුණ තරුණියන් තුළ වැඩි දියුණු කිරීමට ඉවහල්වන ආධ්‍යාත්මික ගුණ වගාව කෙරෙහි අප විශේෂ වශයෙන් සැලකිලිමත් විය යුතුයි.

තරුණ ප්‍රශ්නත් යොවුන් අසහනයත් ගැන කරුණු හරිහැටි තේරුම් නොගත් ඇතැමුන්, පොදුවේ තරුණ පරපුර දෝෂදර්ශනයට ලක්කරනවා; ඔවුන්ව හෙළා දකිනවා. මම හිතන්නෙ ඒක වැරදි පිළිවෙතක් කියලයි. දෝෂාරෝපණයෙන් හෝ හෙළා දැකීමෙන් හෝ තරුණ ප්‍රශ්න විසඳීමට, යොවුන් අසහනය නැති කිරීමට පුළුවන් වෙන්නේ නැහැ. තරුණ ප්‍රශ්න විසඳීමටත් – අසහනය නැති කිරීමටත් ඒවා පිළිබඳ අවබෝධයක් ඇති කරගැනීම ඉතාම අවශ්‍ය යි. යථා අවබෝධය අනුව ප්‍රායෝගික ක්‍රියා මාර්ගයක් අනුගමනය කිරීමෙන් පමණයි ඒවට විසඳුම් සෙවිය හැක්කේ. අර්බුදයක් හේතුකොටගෙන පැන

තනිත අතුරු විෂමතා ගැන විරෝධයක් ඇතිකර ගැනීමෙන් මූලික අර්බුදය මර්දනය කරන්නට බැහැ. අර්බුදයේ සිද්ධාන්තයට ප්‍රතිකර්ම යෙදීමෙන් පමණයි එය මර්දනය කළ හැක්කේ.

මේ වෙලාවෙ මට මතක් වෙනව විතයේ ජීවත් වූ ඉතා ශ්‍රේෂ්ඨ චින්තකයෙක් – දර්ශනිකයෙක් කියපු කියමනක්. මෙන්සියස් නමැති ඒ දර්ශනිකයා මෙන්න මෙහෙමයි තරුණ අසහනය විග්‍රහ කළේ.

" තරුණ ප්‍රශ්න ඇතිකරන්නෙ යොවුන් පරපුර විසින් නොවෙයි. තරුණ අසහනය වූ කලී සමාජයක ස්වරූපය පෙන්වන කැඩපත යි. සමාජය විසින් නිර්මාණය කරන විෂමතා සමාජය විසින්ම නිවැරදි කළයුතුයි. එසේ නොකළහොත් ඒ සමාජයේ දරුවන් විසින්ම එම සමාජය වළලා දමනු නියතයි. "

අපි මූලික කරුණු තුනක් වටහා ගන්න ඕනෑ. පළමුවැනි කාරණේ මේකයි; පසුගිය අවුරුදු හතර පහ ඇතුළත තරුණ පරම්පරාවට තම තත්ත්වය දියුණු කර ගන්න තිබුණු ඉඩ කඩ සීමා වුනා. අපට පාලනය කරන්න බැරි හේතු කිහිපයක් නිසයි වැඩිකොට එහෙම වුනේ. ඒ සම්බන්ධයෙන් යමක් කරන්න දැන් අපට පුළුවන් වෙලා තියෙනව. ඒක කරන්න අපි පසුබා සිටියොත් – ප්‍රමාද උනොත් විවේචනය කරන්නෙ. හෙළා දකින්නෙ අපිව යි.

දෙවැනි කාරණේ මේකයි; සමාජයේ තියෙන විශාල ආර්ථික පරතරයත් සමාජ පරතරයත් නිසා දරුණු අසහනයක් පහළ වෙනවා. අසහනයටත් නොසැනීමටත් පත්වෙන තරුණ පිරිස් ප්‍රචණ්ඩ ක්‍රියාවලටත් කඩාකප්පල් කිරීම්වලටත් ලේසියෙන්ම මුළා කරව ගන්න, පොළඹවගන්න පුළුවනි. නමුත්, ඵල ප්‍රයෝජන සැලසෙන ආකාරයේ වගකීම් බාර දුන්නොත් තරුණ තරුණියන්, තමන්ගෙ හපන්කම් නිර්මාණශීලී අතට හරවනවා. තරුණ තරුණියන් වැඩිදෙනා අපේක්ෂා කරන්නෙත් අර්ථදයක වැඩක නියැළෙන්නයි – නියම අභියෝගවලට මුහුණ දෙන්න යි. ඒවට ඉඩ ලැබුනොත් ප්‍රචණ්ඩ ක්‍රියාවලට උසිගන්වන, අපේක්ෂා සුන්කරවන සමාජ විරෝධීන් කොන්වියාම නිරායාසයෙන්ම සිදුවන්නක්.

තුන්වැනි කාරණේ මේකයි; වයස් පරතරයත් වැටුප් පරතරයත් අඩු කරවන යෝධ වැඩසටහනක් අපට අත්‍යවශ්‍යයි. වෛරයේ විෂමත්වය ඉවත්කරවල, ඒ වෙනුවට තරුණ සිත්වල සැහීමක් – සැනසීමක් ඇති කරවන්න ඕනැ. ඒ යෝධ ව්‍යායාමයේ ඉතා සුළු උත්සාහයක් පමණයි මේ ප්‍රයත්නය.

තරුණ පරපුර වෙනුවෙන් අපේ යුතුකම් ඉටුකිරීමට අපේ ශ්‍රීමත් ජනාධිපතිතුමාගෙන් අපට ලැබෙන ධෛර්‍යය ගැන අපේ හෘදයංගම ස්තුතිය අපි එතුමාට පිරිනමනවා. ඒ වගේම මේ අළුත් වැඩ පිළිවෙළ සාර්ථක කිරීමට බලවත් වූ උත්සාහයකින් ක්‍රියාකරන මගේ නිලධාරීන්ට මම අතිශයින්ම කෘතඥවෙනවා. මේ ශිල්පීය හා කලා කේන්ද්‍රය ශ්‍රී ලංකාවේ තරුණ පරපුරට පිරිනමමින්, මෙහි පරමාර්ථය සාර්ථක කරගැනීමට ඔවුන්ගේ සහභාගීත්වය මම ඉල්ලා සිටිනවා.

ස්තුතියි.

## THE ADDRESS OF THE HON. R. PREMADASA, PRIME MINISTER, ON THE OCCASION OF THE OPENING OF SAVSIRIPAYA–20TH SEPTEMBER, 1987

Today we are assembled here to witness the opening of Savsiripaya. This is the Joint Headquarters of the Institute of Construction Training and Development (ICTAD) and the Tower Hall Theatre Foundation (THTF). You might wonder how the rough and tough vocational training and the delicate and dainty arts can co-exist under one roof. Indeed, the two are strange bed-fellows. But the vocations and the arts must be brought together. After all they are both literally and metaphorically the bread and butter of our lives. At the very outset I must express our gratitude to the World Bank and its Agencies for the generous assistance they gave us to initiate this project.

The opening of "Savsiripaya" marks another important milestone. A milestone in the social, economic and cultural resurgence of Sri Lanka. It is an Institution dedicated to the youth of our country. It attempts to satisfy their growing aspirations. We want to assist the youth to develop their creative abilities and skills in the Trades and the Arts.

"Savsiripaya" will provide opportunities for our youth to participate in the mainstream of the political, economic and social processes. Our Government's endeavour is to enter into a partnership with the youth. It is an urgent demand coming from the heart of our society. To do so we must create the right climate. We must lay the right foundation. We have started on this process already. This is clearly seen today in every hamlet, in every village and in every town.

Today, the youth play an active role in various, voluntary organisations throughout the country. Through these organisations they have earned a place in the Gramodaya Mandalayas. In the political area, the youth must participate in policy making and implementation. The Pradeshiya Sabha system which embraces every A.G.A.'s Division is the grass-root structure for youth participation in Government. This is why we are encouraging young candidates and young political workers to get involved in these public activities. Action is the life-blood of politics. Who is more suitable for action than the youth?

In the economic area, the youth must be provided with training that will bring rewards and fulfil their aspirations and their ambitions. This is why Vocational and Arts Centres like this "Savsiripaya" are so important. Centres for this purpose have been established throughout the country. Savsiripaya is the hub of these decentralized activities.

Our end objective is twofold. A massive economic upliftment through training for employment is one. The other is to inculcate human values through arts and culture. That is our vision for the youth of Sri Lanka.

*Every major Economic Organization or Enterprise must utilize the energies and resources of millions of ordinary men and women, especially the youth. Only if its broad-based benefits are made available can narrow based major Organisations survive. Otherwise, the big become the natural targets of the small.*

In the social, cultural and recreational areas, young people must be provided with better and more appropriate facilities. We have established the Sugathadasa Stadium and the Kettarama Cricket Complex

as the focal points of sports and recreation. They serve the hundreds and thousands of small sports bodies everywhere. Likewise, we have an apex body for Arts and Culture in our Tower Hall Theatre Foundation. It has provided opportunities for our people both young and old to appreciate the Arts. These facilities will assist the youth in the realisation of their creative talents. At the same time, we must provide opportunities for the preservation of moral values. A cultural awakening in them will result in the building up of better human relations.

There are some, who, without examining the problems of youth today, hasten to criticise and denounce them. I think that it is wrong to do so. The problems of youth today cannot be solved by criticism and denunciation. It can only be done by understanding and action. We must not be diverted from the cause of the problem by looking at its side-effects or by-products. Criticising and denouncing these will not enable us to solve the problem.

*I remember the wisdom of the great Chinese sage—Menicus—who said, "The problems of youth are not created by the young. The problems of youth are a mirror of society. What society has created, it must correct."*

We have to realize three basic things.

First, in the past four or five years, opportunities for advancement of our young people have been limited. This is greatly due to circumstances beyond our control. But now we have the opportunity to do something about it. If we hesitate, it is we who will be criticized and denounced.

Second, the large economic and social gap in society produces a deep frustration. Frustrated and dissatisfied youth can be easily misled into violence and disruption.

But youth given rewarding responsibilities turn their talent to creative action. Constructive engagements and positive challenges are what most young men and women want. When they get it the vendors of violence and salesmen of despair will disappear.

*Third, we need a massive programme to make the age gap and the wage gap diminish. We must take away the venom of hatred and replace it with satisfaction for youthful energy.*

I would like to thank His Excellency the President for the encouragement he is giving us to fulfil our obligations towards the cause of our youth. I also owe a debt of gratitude to my officials who spared no pains in making this novel venture a reality. While dedicating this Vocational and Arts Centre to the youth of Sri Lanka, I seek their fullest participation in the realisation of its objectives and ideals.

I thank you.

ජනාධිපති ලේකම් කාර්යාලය
26 AUG 2023
පුස්තකාලය

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව